# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1646/18 - 2010 මාර්තු 24 වැනි බදාදා - 2010.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 11/80.

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යවරයා.

2010 මාර්තු මස 16 වැනි දින,
කොළඹ,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ දී ය.

නියෝග

**2010 - ආහාර (කිරි සහ කිරි නිෂ්පාදනවල අඩංගු මෙලමයින්) නියෝග**

1. මේ නියෝග 2010 ආහාර (කිරි සහ කිරි නිෂ්පාදනවල අඩංගු මෙලමයින්) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2011 ජනවාරි මස 01 දින සිට බලාත්මක වන්නේ ය.

2. කිසිම තැනැත්තකු විසින් මි. ග්‍රෑ./කි.ග්‍රෑ (දශ ලක්ෂයකට කොටස්) 1.0ක් ඉක්මවන මෙලමයින් අන්තර්ගත කිසිම කිරි හෝ කිරි නිෂ්පාදනයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, ප්‍රවාහනය, බෙදාහැරීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

3. කිරි හෝ කිරි නිෂ්පාදන මෙරටට ආනයනය කරන සෑම තැනැත්තෙකුම විසින් එම නිෂ්පාදන රට තුලට ගෙන්වනු ලබන අවස්ථාවේ දී, අවස්ථාවෝචිත පරිදි සම්භවිත රටේ හෝ ආනයනය කරනු ලබන රටේ අදාළ ජාතික අධිකාරිය විසින් එම නිෂ්පාදනය මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුකූල වන බවට ප්‍රකාශ කරමින් නිකුත් කරනු ලබන අනුකූලතා සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

04 - 253

1A - G 12659— 3830 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.